# මුව පැංචාට පාඩමක්



තවීසා චන්තුලී හේරත්

# මුව පැංචාට පාඩමක්

තවීසා චන්තුලී හේරත්

මුව පැංචාට පාඩමක්

© තවීසා චන්තුලී හේරත්
මහාමායා බාලිකා විදුහල
3 ශ්‍රේණිය A
2025.02.08

ISBN 978 - 624 - 208 - 593- 7

# පිදුම

*මා හට අකුරු කියාදී*

*යහමග පෙන්වූ*

*ගුරු මෑණිවරුන්ට සහ ගුරු පියවරුන්ට*

*ආදරයෙන්*

*පුදමි.*

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියත් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. පිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර.

ලොකු කැලෑවක ගල් ගුහාවක පුංචි මුව පවුලක් ජීවත් වුණා. ඒ මුව පවුලේ පුංචි පැටියා තමයි පැංචා

පැංචා හරිම දඟයි. අම්මා කියන කිසිම දෙයක් අහන්නේ නෑ



දවසක් මුව අම්මා කෑම හොයන්න කැලෑවට ගියා අම්මා පැංචාට කියලා ගියේ කොහේවත් යන්නේ නැතුව ගෙදරටම වෙලා ඉන්න කියලයි.



ඒත් මේ දඟකාර පුංචි පැංචා අම්මා කියන දේට පොඩ්ඩක්වත් ඇහුම්කම් දුන්නේ නෑ. එයා අම්මා ඈතට යනකල් ඉඳලා හොරෙන් හොරෙන් අම්මා පිටි පස්සෙන් ගියා.



ඔහොම යනකොට පැංචා දැක්ක අහසේ පියාඹන ලස්සන සමනලී යාට හරිම සතුටු යි පැංචා එයාගේ පුංචි කකුල් වලින් උඩ පැන පැන සමනලයා පිටිපස්සෙන් දුවන්න ගත්තා සමනලයා ඈතට ඈතට පියාඹලා ගියා.



දැන් නම් පැංචාට හරිම මහන්සියි. සමනලයා ගිය පැත්ත හොයාගන්නත් බෑ....

පැංචා වට පිට බැලුවා....

එතකොට තමයි එයාට අම්මාව මතක් උනේ ....

අනේ කෝ මගේ අම්මා ....

අම්මා පේන්නේ නෑ...

මම මේ කොහෙද ඉන්නේ?

අනේ මාව අතර මං වෙලා

පැංචා හොඳටම බය වුණා.

දැන් පැංචාට හොඳටම වතුර තිබහයි. මහන්සි


ඒ වගේම බයයි.



පැංචා අඬ අඬා ම කැලේ ඇතුලේ ඇවිදින්න පටන් ගත්තා ඉර අව්වත් හොඳටම සැරයි. පැංචාට හොඳටම වතුර තිබහයි. ඔහොම ඇවිදගෙන යනකොට ඈත වතුර තියෙනවා වගේ පැංචාට පෙනුනා. පැංචා ඉක්මනට එතනට දුවන්න පටන් ගත්තා. වතුර තියෙන තැන පෙනි පෙනී පැංචා කොච්චර හතිදාගෙන දිව්වත් එයාට වතුර නං හම්බවුණෝ නෑ. මොකද දන්නවද වෙලා තියෙන්නේ එයා දුවලා තියෙන්නේ මිරිඟුවක් පස්සේ ඒ කියන්නේ ගොඩක් අව්ව සැරවෙලාවට පොළොවට ඉර එළිය වැටිලා වැලි කැට දිලිසෙන්න ගන්නව එතකොට ඈතට පේන්නේ එතන වතුර තියෙනවා කියලයි පැංචට රැවටිලා තියෙන්නේ වතුර කියලා අන්න එහෙම තැනකට.



දැන් නම් හොඳටම හවස් වෙලා ඔන්න පැංචාගේ අම්මා පැංචාට පලතුරු එහෙම අරගෙන ගෙදර ආවා.



අනේ පැංචාගේ අම්මා එයාව හැම තැනම හොයනවා. කෝ මේ පැංචා. පැංචෝ පැංචෝ ඔයා කොහෙද ගියේ? මුව අම්මා හරිම කලබලෙන් පැංචාව හොයන්න පටන් ගත්තා.




මුව අම්මා කැලේ ඇතුලට ආයෙමත් දුවන්න පටන් ගත්තා දැන් නම් හොඳටම රෑ බෝවීගෙන එනවා. අනේ මගේ පැංචාකෝ එයා කොහෙද ගියේ? මුවා අම්මා අඬ අඬා කැලෑව ඇතුලේ පැංචාව හෙව්වා.



ඔහොම යනකොට මුවා අම්මා දැක්කා පැංචා කැලේ ගලක් අයිනේ වැටිලා ඉන්නවා. පැංචාගේ අම්මා ඉක්මනට එතනට දුවලා ගියා. අනේ පුංචි පැංචාට කලන්තේ හැදිලා අම්මාට හරියට දුක හිතුනා. එයාට තරහක් ඒත් මූ අම්මා ඉක්මනට පැංචාගේ මූණ ලෙවකෑවා. මොකද මුවා අම්මාට පැංචාට පොවන්න එතෙන්ට වතුර ගේන්න බැහැනේ. පැංචාගේ මූණ ලෙවකන කොට ඔන්න එයා පොඩ්ඩ පොඩ්ඩ ඇස් දෙක ඇරියා ය අම්මාට හරිම සතුටුයි. අනේ මගේ පැංචාට සිහිය ආවා. මුවා අම්මා පැංචාවත් අරගෙන හෙමීට හෙමීට එයාලගේ ගෙදර ගියා.

දැක්කා නේද යාළුවනේ? අම්මලා කියන දේ අහන්නේ නැතුව හිතුවක්කාර වෙන්න ගියොත් පැංචාට උන දේ? අපටත් වෙන්න පුළුවන් ඒක නිසා පුංචි අපි හැමවෙලාවෙම වැඩිහිටියන්ගේ උපදෙස් පිළිපදින්න ඕනේ. එයාලට කීකරු වෙන්න ඕනෙ. අපි තාම පුංචි ළමයි නිසා අපට සමහර දේවල් තේරුම් ගන්න අමාරුයි. වැඩිහිටියන්ට ගුරුවරුන්ට කීකරු ගුණගරුක පුංචි ළමයි මල් වගේ සුවඳ හමනවා එයාලව ස්වාභාව ස්වභාවය ධර්මයෙන් ආරක්ෂා කරනව අපේ අම්මා නම් හැමදාමත් අපිට කියන්නේ එහෙම තමයි





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ එලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්විම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,<br>
සෙනෙවිරත්න මහලේකම්